# ඇබෑර්තු දැන්වීමයි

## සීමාසහිත මාතලේ සමුපකාර ප්‍රාදේශීය ග්‍රාමීය බැංකු සමිතිය

# පුරප්පාඩු අභ්‍යන්තර විගණක තනතුර සඳහා අයදුම්පත් කැඳවීම

සීමාසහිත මාතලේ සමුපකාර ප්‍රාදේශීය ග්‍රාමීය බැංකු සමිතියේ පුරප්පාඩු වී පවතින අභ්‍යන්තර විගණක තනතුර සඳහා මාතලේ දිස්ත්‍රික්කය තුළ පදිංචි සුදුසුකම් ලාභීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**තනතුරට අදාළ සුදුසුකම්**

(අ) ග්‍රාමීය බැංකු අභ්‍යන්තර විගණක තනතුරක වසර 05 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම / පොත් තබන්නා තනතුරේ වසර 03 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම / කළමනාකරු (ව්‍යාපෘති) / කළමනාකරු - 1 ( ස.ණ.ස. සමිති / වෙනත් මූල්‍ය ආයතන ) වසර 05 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම / ග්‍රාමීය බැංකු කළමනාකරු තනතුරේ වසර 05 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම / පරිපාලක ( වෙළඳසැල් ) තනතුරක වසර 05 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම.

**හෝ**

(ආ) මාස 09ට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත ගණකාධිකරණය / විගණනය පිළිබඳ ඩිප්ලෝමාවක් සමත් වීම සමග ග්‍රාමීය බැංකු අභ්‍යන්තර විගණක තනතුරක / ග්‍රාමීය බැංකු කළමනාකරු තනතුරක / පොත් තබන්නා තනතුරක හෝ කළමනාකරු - 1( ස.ණ.ස. සමිති / වෙනත් මූල්‍ය ආයතන) වසර 03 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම. / පරිපාලක (වෙළඳසැල්) තනතුරක වසර 04 ක ස්ථිර සේවා පළපුරුද්දක් තිබීම.

**හෝ**

(ඇ) පිළිගත් විශ්වවිද්‍යාලයක / පිළිගත් ආයතනයක ගණකාධිකරණය / කළමනාකරණය පිළිබඳ උපාධියක් සමත්වී තිබීම/ උසස් තාක්ෂණ ආයතනයේ ගණකාධිකරණය / වාණිජ / කළමනාකරණ ඩිප්ලෝමාව සමත් වී තිබීම.

**හෝ**

(ඈ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අදියර ii (Charted Level II) / ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ අදියර 11 ( AAT. Level II) සමත් වීම.

I. **වැටුප් හා දීමනා**

- වැටුප් පරිමාණ අංකය - EL - 03:01
- වැටුප් පරිමාණය - 28500 – 570 x 10 - 855 x 10 - 1140 x 10 = 54150/-
- වැටුපට අමතරව මධ්‍යම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ අනුමත දීමනා හිමි වේ.
- තම කාර්ය සාධනය අනුව ආකර්ෂණීය දිරි දීමනා සඳහා හිමිකම් ඇත.

II. **වයස් සීමාව**

වයස් සීමාව අවු. 18 – 45 අතර

**පොදු කරුණු**

- අයදුම්කරුවන් මාතලේ දිස්ත්‍රික්කය තුළ පදිංචිකරුවන් විය යුතුය.
- තනතුරට පැවරෙන කාර්යයන් ඉටු කිරීම සඳහා කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත පුද්ගලයින් විය යුතුය.
- අභ්‍යන්තර තනතුර පිළිබඳ ලබා ඇති පුහුණුව විශේෂ සුදුසුකමක් වනු ඇත.
- පරිගණක දැනුම හා ඉංග්‍රීසි දැනුම අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**අයදුම්පත් යොමු කිරීම**

- අයදුම්පත් මධ්‍යම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ අංක 5/2024 චක්‍ර ලේඛයේ සඳහන් ආකෘතියට අනුව සකස් විය යුතුය.
- 5/2024 චක්‍රලේඛනය අනුව සකස් කළ අයදුම්පත් සී/ස මාතලේ සමුපකාර ප්‍රාදේශීය ග්‍රාමීය බැංකු සමිතියේ පලාපත්වල පිහිටි ප්‍රධාන කාර්යාලයෙන් ද ලබාගත හැකිය.
- අසම්පූර්ණ හා අයදුම්පත් භාර ගැනීමේ නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- අධ්‍යාපන සුදුසුකම්, පළපුරුද්ද, පදිංචිය සනාථ කිරීමේ සහතිකය, ජාතික හැඳුනුම්පත හා උප්පැන්න සහතිකය යන සහතිකවල පිටපත් අයදුම්පතට අමුණා ඉදිරිපත් කළ යුතුය.
- **අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය 2025.08.03 දින වේ.**

ඉහත සඳහන් අභ්‍යන්තර විගණක තනතුරට ඔබත් සුදුස්සෙක් නම් නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත පහත ලිපිනයට අයදුම්පත් භාර ගැනීමේ දිනට පෙර ලැබෙන ලෙස ලියාපදිංචි තැපැලෙන් යොමු කරන්න.

**ගරු සභාපති,**
**සී/ස මාතලේ සමුපකාර ප්‍රාදේශීය ග්‍රාමීය බැංකු සමිතිය,**
**පලාපත්වල, මාතලේ.**
2025.07.14
066-2220335 / 2220333/2220383